

# ශ්‍රී ලංකා බයිබල් සංගමය



සංවිධානය කරන

50 වන වාර්ෂික බයිබල් රචනා තරගය - 2019

ශ්‍රී ලංකා බයිබල් සංගමය මගින් පවත්වනු ලබන සමස්ත ලංකා බයිබල් රචනා තරගය අප ශ්‍රී ලංකාවේ දරුදැරියන් හට බයිබලය පිළිබඳ ඔවුන්ගේ දැනුම වැඩිකර ගැනීමට මහත් උපකාරයක් වී ඇත. එමෙන්ම එය ඔවුන්ගේ ජීවිතයට ඉමහත් ආශීර්වාදයක් ද වේ.
මේ සඳහා ඔබ පාසලේ, සභාවේ, ඉරුදින දහම් පාසලේ දරුදැරියන් සහභාගී කරවීමට උනන්දු කරන ලෙස ඔබගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. මෙම තරගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්, වයස් කාණ්ඩ තුනකට පැවැත්වේ. තරගයට අදාළ මාතෘකා සහ විස්තර පහත සඳහන් වේ.

| | වයස | මාතෘකාව | වචන |
|---|---|---|---|
| ප්‍රාථමික | අවුරුදු 9-12 | "ඉල්ලන්න, ඔබට දෙනු ලැබේ; සොයන්න, ඔබට සම්බ වේ; තට්ටු කරන්න, ඔබට දොර අරිනු ලැබේ." **(මතෙව් 7:7)** | 400-500 අතර |
| කනිෂ්ඨ | අවුරුදු 13-16 | "මිනිසා ජීවත් වන්නේ කෑමෙන් පමණක් නොව; දෙවියන් වහන්සේගේ මුවින් නික්මෙන සියලු වචන වලින් ය." **(මතෙව් 4:4)** | 500-700 අතර |
| ජ්‍යෙෂ්ඨ | අවුරුදු 17-19 | "දේව ගරුබිය ප්‍රඥාවේ මුල් පියවර යි; අනුවණයෝ නැණනුවණ හා විනය ධර්ම හෙළා දකිති." (හිතෝපදේශ 1:7) | 1000 -1500 අතර |

මෙම තරගයට ඇතුළු වන සෑම තරගකරුවෙක්ම 2019 අප්‍රේල් මස 1 වන දිනට අදාළ වයස් සීමාව තුළසිටිය යුතු ය. සෑම රචනාවක්ම අයැදුම්කරුගේ නම, ලිපිනය සහ දුරකථන අංකය සමග ඉදිරිපත් කළ යුතු අතර, ඉරුදින පාසලේ ප්‍රධානියා/ පූජකතුමා/ විදුහල්පති විසින් පහත සඳහන් කරුණු සහතික කළ යුතු ය.

- අයැදුම්කරුගේ උපන් දිනය සහ වයස
- රචනාව අයැදුම්කරුගේම නිර්මාණයක් බව
- අයැදුම්කරුගේම අත් අකුරින් ඉදිරිපත් කර ඇති බව

සෑම රචනාවක්ම අයැදුම් පත්‍රය සමග අමුණා, *වාර්ෂික බයිබල් රචනා තරගය, ශ්‍රී ලංකා බයිබල් සංගමය, 293, ගාලු පාර, කොළඹ 03.* යන ලිපිනයට 2019 මැයි 17 වන දිනට පෙර ලැබෙන සේ එවිය යුතුයි. සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවෙන් රචනාව ඉදිරිපත් කළ හැකිය.
*(ඔබගේ රචනාවේ අඩංගු වචන ගණන සමග බයිබල් පද උපුටා ගනු ලැබුවේ නම් එය ද පැහැදිලිව සඳහන් කළ යුතු ය.)*

වැඩි විස්තර සඳහා ශිරෝමි එදිරිසූරිය විමසන්න, *දුරකථන 011-565583/4, යොමුව:109*
භාෂා තුනෙන් තේරී පත්වූ පළමුවන, දෙවන හා තුන්වන ස්ථාන ලබාගත් සිසුනට ශ්‍රී ලංකා බයිබල් සංගමයෙන් ත්‍යාග සහ සහතික පිරිනැමෙන අතර සහභාගී වූ අන් සෑමට සහතික පතක් හිමි වනු ඇත. එබැවින් ඔබේ නම සහ ලිපිනය ඉංග්‍රීසි කැපිටල් අකුරින් පැහැදිලිව අයැදුම් පතෙහි සඳහන් කරන්න.
*(මෙම අයැදුම් පතින් ඔබට අවශ්‍ය ප්‍රමාණයට ඡායා පිටපත් ලබාගත හැක.)*

==========================================

ගරු ප්‍රියන්ත විජේගුණවර්ධන දේවගැතිතුමා
(ලේඛකාධිකාරී තුමා)

ඉල්ලුම් පත්‍ර සඳහා පහතින් දී ඇති ශ්‍රී ලංකා බයිබල් සංගමයේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය

**www.ceylonbiblesociety.org**